# අ.පො.ස.(උසස් පෙළ)

# ආර්ථික විද්‍යාව



## ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව

### ප්‍රශ්න සහ පිළිතුරු

**නිපුණතාවය 1.4 : ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව තාර්කිකව විශ්ලේෂණය කරයි.**




## ප්‍රශ්න අංක 01

ඉහත රූප සටහනෙහි දැක්වෙන කාන්තාව කවර ගැටලුවකට මුහුණ පා සිටී ද යන්න පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න.

පිළිතුර :

සැපයෙන සීමිත ජල ප්‍රමාණයෙන් රෙදි සේදීම, ආහාර පිසීම, නෑම යනාදී වුවමනා බොහොමයක් ඉටු කර ගන්නේ කෙසේදැයි යන ගැටලුවට ඇය මුහුණ පා සිටී.


Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.4 : ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව තාර්කිකව විශ්ලේෂණය කරයි.**

## ප්‍රශ්න අංක 02

ඉහත රූප සටහනෙහි දැක්වෙන තොරතුරු ද සැලකිල්ලට ගනිමින් හිඟකම යන සංකල්පය නිර්වචනය කරන්න.

පිළිතුර :

හිඟකම යනු මිනිස් වුවමනා සපුරා ගැනීම සඳහා සමාජය සතු සම්පත් සම්භාරය ප්‍රමාණවත් නොවීමයි.

## ප්‍රශ්න අංක 03

සමාජයක් තුළ හිඟකම ප්‍රශ්නය පැන නගිනුයේ කවර හේතූන් නිසා ද?

පිළිතුර :

හිඟකම ප්‍රශ්නය පැන නගිනුයේ ප්‍රධාන හේතූන් (සමාජයක් තුළ පවත්නා ප්‍රධාන ලක්ෂණ) දෙකක් නිසා ය.

1. යම් දෙන ලද අවස්ථාවක මිනිසුන්ගේ <u>වුවමනා අසීමිත වීම.</u>
2. යම් දෙන ලද අවස්ථාවක එම වුවමනා සපුරා ගැනීමට අවශ්‍ය කෙරෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදා ගත හැකි <u>සම්පත් ප්‍රමාණය සීමිත වීම.</u>

## ප්‍රශ්න අංක 04

හිඟකම සාපේක්ෂ සංකල්පයකි. මෙයින් කුමක් අදහස් වේ ද?

පිළිතුර :

- මිනිස් වුවමනා අසීමිත ය. එම අසීමිත මිනිස් වුවමනාවන්හි ප්‍රමාණය හා <u>සසඳා බැලීමේ දී</u> ඒවා සපුරා ගැනීම සඳහා පවත්නා සම්පත් ප්‍රමාණය සීමිත වේ.
- මෙලෙස අසීමිත වුවමනාවන් සමඟ සීමිත සම්පත් සසඳා බැලීමේ දී පමණක් හිඟකම සංකල්පය ගොඩ නැගේ. මේ නිසා හිඟකම සාපේක්ෂ සංකල්පයක් වේ.


Copyright © e-thaksalawa.moe.gov.lk

නිපුණතාවය 1.4 : ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව තාර්කිකව විශ්ලේෂණය කරයි.

- මිනිස් වුවමනා අසීමිත නොවේ නම් එනම් සම්පත් පවතින තරමට වුවමනා ද පවතී නම් හිඟකම ප්‍රශ්නය මතු නොවේ.
- එසේ ම මිනිස් වුවමනා අසීමිත වන තරමින් ම සම්පත් ද අසීමිත ව සැපයේ නම් එහි දී ද හිඟකම ප්‍රශ්නයක් මතු නොවේ.

## ප්‍රශ්න අංක 05

වෙළෙඳපොළක පවතින සැපයුම් ඌනතාවක් හිඟකම සංකල්පයෙන් අදහස් වේ ද? පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

පිළිතුර :

- නැත.
- වෙළෙඳපොළක පවතින සැපයුම් ඌනතාවක් යනු ඉල්ලුමට සරිලන පරිදි සැපයුමක් නොතිබීමයි. මෙය වෙළෙඳපොලක පවත්නා තාවකාලික අසමතුලිතතාවක් පමණි. එහෙත් වෙළෙඳපොලේ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය තොග වෙළෙඳපොලට ළඟා වීමත් සමඟ වෙළෙඳපොළෙහි පවතින එම සැපයුම් ඌනතාව හෙවත් තාවකාලික හිඟය ඉවත් වී යයි. එහෙත් හිඟකම යන සංකල්පයෙන් කියවෙන්නේ මෙවැනි තාවකාලික හිඟයක් නොවේ. එය මිනිස් වුවමනා අසීමිත වන තාක් කල් නොවිසඳී පවත්නා සමස්ත සමාජයේ සෑම දෙනෙකුම පොදුවේ මුහුණ දෙන ප්‍රශ්නයකි.

## ප්‍රශ්න අංක 06

"ඉතියෝපියාව වැනි ඉතා පහළ ආදායම්ලාභී රටවල් උග්‍ර ආහාර අර්බුදයන්ට මුහුණ දී සිටී. නමුත් ඇමරිකාව වැනි ඉහළ ආදායම්ලාභී රටවල එවැනි ආහාර අර්බුද නොපවතී. එසේ නම් ඇමරිකාව හිඟකම ප්‍රශ්නයට මුහුණ නොදේ." මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වේ ද? පිළිතුරට හේතු පැහැදිලි කරන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk

පිළිතුර :

- එකඟ නොවේ.
- හිඟකම ප්‍රශ්නයට හේතු වන්නේ අසීමිත වුවමනා හා සීමිත සම්පත් ය. ඇමරිකාවට ආහාර ප්‍රශ්නයක් නොවුව ද එවැනි ප්‍රශ්න ඉක්මවා ගිය තවත් නොයෙක් වුවමනා තිබිය හැක. නිදසුන් වශයෙන් අභ්‍යවකාශය තරණය කිරීමට සෑම ඇමරිකානුවකුට ම වුවමනා විය හැක. ඒ සඳහා අවශ්‍ය සම්පත් ඇමරිකාවට ප්‍රමාණවත් නොවිය හැක. එසේ නම් එහි දී ඇමරිකාව ද හිඟකම ප්‍රශ්නයට මුහුණ දේ.
- දුප්පත්, පොහොසත්, උගත්, නූගත්, ජාති, ආගම් ආදී කිසිම භේදයකින් තොර ව සමාජයේ සිටින සෑම අයෙකු ම පොදුවේ හිඟකම ප්‍රශ්නයට මුහුණ දේ.

## ප්‍රශ්න අංක 07

"ඉතා පිරිමැසුම්දායක ලෙස සම්පත් භාවිත කිරීමෙන් හිඟකම ප්‍රශ්නය විසඳාගත හැකිය." මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වේ ද? පිළිතුරට හේතු දක්වන්න.

පිළිතුර :

- එකඟ නොවේ.
- පිරිමැසුම්දායක සෙල සම්පත් භාවිත කිරීම යන්නෙන් අදහස් වන්නේ හිඟ සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමයි. සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම තුළ දී යෙදවුම්වලින් මිනිසුන්ගේ වරණය අනුව උපරිම නිමවුම් බිහිකර ගනිමින් යම් කිසි අවස්ථාවකට අදාළ වූ වුවමනා ඉටු කර ගනී. එහෙත් මිනිසුන්ගේ වුවමනා අඛණ්ඩ ව නිරන්තරයෙන් වැඩි වේ. එසේනම් මිනිස් වුවමනා අසීමිත වන තාක් කල් පිරිමැසුම්දායක ලෙස සම්පත් භාවිත කළ පමණින් හිඟකම ප්‍රශ්නය නොවිසඳේ.



e තක්සලාව The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

නිපුණතාවය 1.4 : ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව තාර්කිකව විශ්ලේෂණය කරයි.

## ප්‍රශ්න අංක 08

ඉඩම් අක්කරයක් ප්‍රයෝජනයට ගත හැකි ආකාර කිහිපයක් නම් කර එම තොරතුරු ඇසුරින් හිඟ සම්පත් විකල්ප ප්‍රයෝජන යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

පිළිතුර :

- පොල් වගා කිරීම.
- ක්‍රීඩා පිටියක් ඉදි කිරීම.
- කුලියට දීමට නිවාස ඉදි කිරීම.
- කර්මාන්තශාලාවක් ඉදි කිරීම.

- ඉඩම් අක්කරය හිඟ සම්පතකි. එම හිඟ සම්පතෙහි ඉහත දක්වා ඇති භාවිතයන්ට අමතර ව තවත් නොයෙකුත් භාවිතයන් පවතී.
- මෙලෙස හිඟ සම්පතක පවත්නා විවිධ භාවිතයන් හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන නම් වේ.

## ප්‍රශ්න අංක 09

ඉහත දැක්වූ අක්කරයක ඉඩමෙහි පවත්නා විකල්පයන්ගෙන් ඔබ යම් අවස්ථාවක තෝරා ගැනීමට කැමති විකල්පය දක්වා ඒ වෙනුවෙන් ඔබට අත් හැර දැමීමට සිදු වන අනෙකුත් විකල්ප මොනවාදැයි දක්වන්න.

පිළිතුර :

- තෝරා ගත් විකල්පය - පොල් වගා කිරීම
- අත් හැර දැමීමට සිදු වන විකල්ප-
  - ක්‍රීඩා පිටියක් ඉදි කිරීම.
  - කුලියට දීමට නිවාස ඉදි කිරීම.
  - කර්මාන්තශාලාවක් ඉදි කිරීම.


Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.4 : ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව තාර්කිකව විශ්ලේෂණය කරයි.**

## ප්‍රශ්න අංක 10

ඉහත ඔබ තෝරා ගත් විකල්පය නිසා ඔබට අතහැර දැමීමට සිදු වන විකල්ප අතරින් ඔබ ඊළඟට වඩාත් කැමැත්තෙන් සිටි විකල්පය කුමක දැයි දක්වන්න.

පිළිතුර :

- ක්‍රීඩා පිටියක් ඉදි කිරීම.

## ප්‍රශ්න අංක 11

ඉහත ඔබ විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ද සැලකිල්ලට ගනිමින් ආවස්ථික පිරිවැය යන සංකල්පය නිර්වචනය කරන්න.

පිළිතුර :

- කිසියම් තේරීමක් නිසා අත්හැර දැමීමට සිදු වන හෙවත් කැප කිරීමට සිදු වන ඊළඟ හොඳ ම විකල්පයේ වටිනාකම ආවස්ථික පිරිවැය නමින් හැඳින්වේ.
- ඉහත ඉදිරිපත් කරන ලද නිදසුනට අනුව ඉඩම් අක්කරයේ විකල්ප අවස්ථාවලින් පොල් වගා කිරීම යන අවස්ථාව තෝරා ගැනීම නිසා ඒ වෙනුවෙන් කැප කළ ඊළඟ හොඳ ම විකල්ප අවස්ථාව වූයේ ක්‍රීඩා පිටියක් ඉදි කිරීමයි. මේ අනුව පොල් වගා කිරීමේ ආවස්ථික පිරිවැය ක්‍රීඩා පිටියේ වටිනාකමයි.

## ප්‍රශ්න අංක 12

ආවස්ථික පිරිවැය හා සම්බන්ධ විශේෂිත ලක්ෂණ කවරේ ද?

පිළිතුර :

<u>ආවස්ථික පිරිවැය පූර්ණ සංකල්පයකි.</u>

- නිදසුන - ඉහත නිදසුනෙහි දී පොල් වගා කිරීමේ ආවස්ථික පිරිවැය ක්‍රීඩා පිටියේ වටිනාකමයි. මෙහි දී වටිනාකම ලැබෙන්නේ කැප කරන ලද ක්‍රීඩා පිටියටය. ක්‍රීඩා පිටිය මූර්ත වේ.


Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.4 : ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව තාර්කිකව විශ්ලේෂණය කරයි.**

ආවස්ථික පිරිවැය ආත්මගත සංකල්පයකි.

- යම් කිසි අවස්ථාවකට අදාළ ආවස්ථික පිරිවැය ඒ ඒ පුද්ගලයාට ආවේණික වේ. ඉහත සැලකිල්ලට ගත් නිදසුන අනුව පොල් වගා කිරීමේ ආවස්ථික පිරිවැය යම් අයෙකුට ක්‍රීඩා පිටිය ඉදි කිරීමට වුවත් තවත් අයෙකුට කර්මාන්තශාලාවක් ඉදි කිරීම විය හැක.

ආවස්ථික පිරිවැය නිසා බාහිර පිරිවැයක් හට ගනී.

- යම් අවස්ථාවක තෝරා ගත් විකල්පය කර්මාන්තශාලාවක් නම්, එම කර්මාන්තශාලාව නිසා මිනිසුන් දෛනික ව භාවිතයට ගන්නා ළිඳක ජලය අපවිත්‍ර වේ නම් එම ජලය භාවිත කිරීමෙන් මිනිසුන් රෝගී වී පිරිවැයක් ඇති විය හැක. එය කර්මාන්තශාලාවක් ඉදිකිරීම නිසා හටගත් බාහිර

**ප්‍රශ්න අංක 13**

ජල විදුලි බලාගාරයක ජල විදුලි උත්පාදක යන්ත්‍රයක ආවස්ථික පිරිවැය ශූන්‍ය වේ. එසේ වන්නේ ඇයි?

පිළිතුර :

- විදුලි උත්පාදක යන්ත්‍රය භාවිත කරනු ලබන්නේ විදුලිය නිපදවීමට පමණි. එම යන්ත්‍රය වෙනත් කිසිදු භාවිතයක් සඳහා යොදා ගත නොහැක. එහෙයින් එහි ආවස්ථික පිරිවැයක් නොපවතී.
- මේ අනුව හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන නොමැති වන විට හෙවත් කිසියම් හිඟ සම්පතක පවතින්නේ එක් විකල්පයක් පමණක් නම් එහි දී ආවස්ථික පිරිවැයක් නොපවතී.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## ප්‍රශ්න අංක 14

ආවස්ථික පිරිවැය ශුන්‍ය වන තවත් එබඳු අවස්ථා පවතී ද? එසේ නම් ඒ කවරේදැයි දක්වන්න.

පිළිතුර :

- ඔව්.
- නොමිල සම්පත් පවතින විට ආවස්ථික පිරිවැයක් නොපවතී. වාතය, ජලය, හිරු එළිය වැනි නොමිල සම්පත්වල සැපයුම අසීමිත වන හෙයින් එහි දී කැප කිරීමක් සිදු නොවේ.
- සම්පත්වල සේවා වියුක්තියක් පවතින විට ද ආවස්ථික පිරිවැය ශුන්‍ය වේ.
    - නිදසුන -
        - යෝගට් සෑදීම සඳහා අවශ්‍ය වන්නේ ශ්‍රමිකයින් 50කි. එහෙත් එම නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ ශ්‍රමිකයෝ 65ක් සිටිති. මුදවපු කිරි නිෂ්පාදනය සඳහා ශ්‍රමිකයන් 40ක් අවශ්‍යයි. එහෙත් ඒ සඳහා සිටින්නේ ශ්‍රමිකයින් 30කි.
        - මෙහි දී යෝගට් නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි වැඩිපුර සිටින ශ්‍රමිකයන් 15 දෙනාගෙන් 10 දෙනෙක් මුදවපු කිරි නිපදවීමට යොදා ගත හැක.
        - මෙහි දී යෝගට් නිෂ්පාදනයේ යෙදී සිටින ශ්‍රමිකයන් එසේම සිටිය දී එහි සේවා වියුක්ත පිරිසෙන් කොටසක් මුදවපු කිරි නිපදවීමට යොදා ගැනීමේ දී ආවස්ථික පිරිවැයක් නොමැත.
        - හේතුව සේවා වියුක්ත සම්පතක් භාවිතයට ගැනීමක් මෙහි දී සිදු ව ඇති නිසා ය.

## ප්‍රශ්න අංක 15

ආවස්ථික පිරිවැය ශුන්‍ය වන අවස්ථා තුනක් නම් කරන්න.

පිළිතුර :

1. හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන නොමැති විට.
2. නොමිල සම්පත් පැවතීම.
3. සම්පත් සේවා වියුක්ත ව පැවතීම.


The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**නිපුණතාවය 1.4 : ආර්ථිකයක කේන්ද්‍රීය ගැටලුව තාර්කිකව විශ්ලේෂණය කරයි.**

## ප්‍රශ්න අංක 16

හිඟකම සහ ආවස්ථික පිරිවැය අතර සම්බන්ධතාව විස්තර කරන්න.


Copyright © e-thaksalawa.moe.gov.lk